# ශ්‍රී ලංකා අයවැය 2023:

## *රජයේ වියදම් සඳහා ප්‍රධාන අංශවලට මහජන ප්‍රමුඛත්වය හිමිවේ*

*අධ්‍යාපනය, සෞඛ්‍යය සහ කෘෂිකර්මාන්තය ආයෝජන සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර වේ.*

රජය අර්බුදය හමුවේ වියදම් සාධාරණීකරණය කිරීමට අරගල කරන විට, බොහෝ ශ්‍රී ලාංකිකයන්ගේ වියදම් ප්‍රමුඛතාවයන් පිළිබඳ ඇති අදහස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ප්‍රමුඛතාවයන් සමඟ බොහෝ සෙයින් සමාන වේ. බහුතර ශ්‍රී ලාංකිකයන්ට අවශ්‍ය වනුයේ රජයේ ප්‍රමුඛත්වය, සෞඛ්‍යය හා අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා වන වියදම් ඉහළ නැංවීමට ලබා දීම වන අතරම කෘෂිකර්මාන්තය සඳහා ද වියදම් ඉහළ නැංවීම කෙරෙහි වැඩි ජනතා මනාපයක් ඇත. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස, පොලිසියට සහ මාර්ග සඳහා වියදම් අඩු කිරීම කෙරෙහි වැඩි මහජනතාව ප්‍රමුඛත්වය ලබා දී අතර, හමුදාව සඳහා වියදම් කපා හැරීම ප්‍රමුඛතාවයක් විය යුතු යැයි බොහෝ දෙනා සිතන්නේ නැත.

**බොහෝ ශ්‍රී ලාංකිකයන් සෞඛ්‍යය හා අධ්‍යාපනය සඳහා වියදම් වැඩි කිරීමට ප්‍රමුඛත්වය දෙන අතර විශාල පිරිසක් මාර්ග සහ පොලිසිය සඳහා වන වියදම් කපා හැරීම සඳහා ප්‍රමුඛත්වය දෙති.**




**IHP ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය**
2022 ඔක්. 4 - නොවැ. 23 දක්වා වැඩිහිටියන් N=475 (වියදම් ඉහළ නැංවීම) සහ 401 (වියදම් අඩු කිරීම) ක් ඇසුරෙනි.

ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය (SLOTS) මගින් 2022 ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාසවලදී කරන ලද අදහස් විමසීමේදී රජයේ වැඩි කළ යුතු වියදම් සහ කපා හැරිය යුතු දැනට පවතින වියදම් අතර ඉහළම ප්‍රමුඛතාවයන් දෙක පිළිබඳව සහභාගිවන්නන්ගෙන් වෙන වෙනම විමසන ලදී.

රජයේ වැඩි කළ යුතු වියදම් සඳහා ඔවුන්ගේ ප්‍රමුඛතාවයන් පිළිබඳව විමසූ විටදී, ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගෙන් 66% ක් සෞඛ්‍යය සහ 60% ක් අධ්‍යාපන අංශ ඉහළම ප්‍රමුඛතාවයන් දෙක ලෙස හඳුනා ගන්නා ලදී. මෙය මූල්‍ය ගැලපුම් ක්‍රියාවලියේ කොටසක් වශයෙන් රජය සැබෑ ලෙස සෞඛ්‍යය හා අධ්‍යාපනය සඳහා වන වියදම් වැඩි කරන බවට වූ IMF නිර්දේශයන්ට අනුකූල වේ. ඊළඟ ඉහළම ප්‍රමුඛතා කාණ්ඩයන් ලෙස 49% ක් කෘෂිකර්මාන්ත සහ ගොවිතැන සඳහාද, 15% ක් පොහොර ලෙස පෙන්වා ඇත.

ඊට ප්‍රතිවිරුද්ධව, රජයේ කපා හැරිය යුතු වියදම්වල ඉහළම ප්‍රමුඛතාවයන් දෙක හඳුනා ගැනීමට විමසූ විටදී, ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගෙන් 44% සහ 37% සමාන සංඛ්‍යාවක් පිළිවෙලින් පොලිසිය සහ මාර්ග අංශයන් දෙක හඳුනා

ගන්නා ලදී. කුඩා නමුත් සැලකිය යුතු සංඛ්‍යාවකට, සමෘද්ධි (30%) සහ හමුදාව (20%) සඳහා වන වියදම් කපා හැරීමට අවශ්‍ය විය.

විවිධ කණ්ඩායම් අතර ප්‍රමුඛතා බොහෝ දුරට සමාන වන නමුත් ශ්‍රී ලාංකිකයන්ගෙන් පහළම ආදායම් ලබන තුනෙන් එක වැඩි වශයෙන් කෘෂිකර්මය (62%) සහ පොහොර (33%) වැඩි කල යුතු වියදම්වල ප්‍රමුඛතාවන් ලෙස හඳුනා ගෙන ඇති අතර අනෙකුත් ශ්‍රී ලාංකිකයන්ට සාපේක්ෂව ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉහළම ආදායම් ලබන තුනෙන් එක (45%) වැඩි වශයෙන් කපාහැරිය යුතු වියදම්වල ප්‍රමුඛතාවයක් ලෙස සමෘද්ධිය හඳුනා ගෙන ඇත. හමුදාව සම්බන්ධයෙන් ජනවාර්ගික කණ්ඩායම් අතර එකඟතාවයක් නොමැති අතර, සිංහල නොවන වැඩිහිටියන්ගෙන් අඩක් කපාහැරිය යුතු වියදම්වල ප්‍රමුඛතාවය ලෙස හමුදාව හඳුනාගෙන ඇති අතර, එය සිංහල වැඩිහිටියන් දස දෙනෙකුගෙන් එක් අයෙකුට පමණි. කෙසේ වෙතත්, සියලු වාර්ගික කණ්ඩායම්වල විශාල සංඛ්‍යාවක් කපාහැරිය යුතු වියදමක් ලෙස පොලිසිය හඳුනා ගෙන ඇත.







## සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP)

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත සමීක්ෂණ සිදු කර ඇත.

## ක්‍රමවේදය

2019 දී ක්ෂේත්‍ර සමීක්ෂණයක් සඳහා බඳවා ගන්නා ලද විශාල ජාතික ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සංඛ්‍යාවකගෙන් ලබාගත් ජාතික නියැදියකින් සහ අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් ප්‍රතිචාර දැක්වූවන්ගේ වෙනම නියැදියකින් ලබාගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) සම්මුඛ පරීක්ෂණ දත්ත SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලැබේ. ස්ත්‍රී පුරුෂ භාවය, වයස, වාර්ගිකත්වය, පළාත, අංශය සහ ආර්ථික තත්ත්වයේ වෙනස්කම් අනුව අදාළ ප්‍රතිචාර සකස් කර ඇත.

නීලන් තිරුචෙල්වම් භාරය, ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP පර්යේෂණ ආයතනය සම්බන්ධ කර ගත හැක.